- සියලුම ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරන්න.

01. පහත පිළිතුර අතරින් අජීවී ද්‍රව්‍ය පමණක් ඇති පිළිතුර තෝරන්න.
1. ළමයා, පොල් ගස, ගඩොල
2. ගඩොල, පෑන, මකනය
3. ජලය, බයිසිකලය, ගිරවා
4. පොල්ගස, අඹ ගස, මෑ වැල

02. රෙදි සේදීමේදී ඉතා හොඳින් කුණු ඉවත් කරගත හැක්කේ පහත කුමන ජලය භාවිතයෙන් ද?
1. ළිං ජලය
2. ගංගා ජලය
3. මුහුදු ජලය
4. වර්ෂා ජලය

03. ක්ෂුද්‍ර ජීවීන් හොඳින් නිරීක්ෂණය කළහැකි අවස්ථාව තෝරන්න.
1. එළිමහන් ස්ථානයක ජලය පියවි ඇසින් නිරීක්ෂණය කිරීම.
2. අත් කාචයක් තුළින් පල්වූ ජලය නිරීක්ෂණය කිරීම.
3. කොම්පෝස්ට් පොහොර දියකර ලබාගත් ජලය කාචයකින් නිරීක්ෂණය කිරීම.
4. පල්වූ ජලය අන්වීක්ෂයකින් නිරීක්ෂණය කිරීම.

04. අත් කාචයකින් එකවරකදී වැඩිම ජීවීන් සංඛ්‍යාවක් නිරීක්ෂණය කිරීමට හැකිවන්නේ,
1. පළඟැටියන්
2. හැකරැල්ලන්
3. වේයන්
4. ගොළුබෙල්ලන්

05. පිළිවෙලින් ශාක, සතුන් හා ක්ෂුද්‍ර ජීවීන් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. කෙසෙල්, කුරුමිණියා, වේයා
2. නෙළුම්, ඉස්ගෙඩියා, බැක්ටීරියා
3. වේයා, බැක්ටීරියා, කෙසෙල්
4. කෙසෙල්, ඉස්ගෙඩියා, වේයා

06. සංචරණයක් හෝ චලනයක් දක්නට නොලැබෙන්නේ,
1. මුහුදු මල
2. නිදිකුම්බා
3. ගැඩවිලා
4. බයිසිකලය

07. යම් ජීවියෙකු ස්වයංපෝෂී ලෙස හැඳින්වීමට එම ජීවියා සතුවිය යුතු ප්‍රධානතම ලක්ෂණය වන්නේ,
1. ඔවුන් ස්වසනය කිරීමයි.
2. වර්ධනය වීමයි.
3. ප්‍රභාසංස්ලේෂණය කිරීමයි.
4. සංචරණය කිරීමයි.

08. සතුන් , ශාක භක්ෂක සහ මාංශ භක්ෂක ලෙස වර්ග කිරීමේදී පදනම් කරගත්තේ,
1. භෝජන ක්‍රමයයි.
2. භෝජන විලාසයයි.
3. සංචරණ ක්‍රමයයි.
4. [illegible]

LIVEWORKSHEETS